පාසල් සංගණනය -2021

පාසලේ භෞතික පහසුකම් පිළිබඳ තොරතුරු රැස්කිරීමේ උපලේඛනය (PF1)

සම්පූර්ණ කිරීමේ අවධානයට ලක්කල යුතු විශේෂ කරුණු

සියළුම විදුහල්පතිගේ අවධානය සඳහා :

රටේ සමස්ථ පාසල් පද්ධතිය සංවර්ධනය කිරීමේ වැඩසටහන් සඳහා පාදක තොරතුරු ලබාගැනීමේ අරමුණින් මෙම තොරතුරු රැස්කරන බැවින් ඔබ පාසල සතු භෞතික පහසුකම් පිළිබඳ සත්‍ය තොරතුරු ම පමණක් මෙහි ඇතුළත් කළ යුතු අතර මෙහිදී ඇතුළත් කරනු ලබන තොරතුරු 100 % ක්ම නිවැරදි බවට ඔබ විසින් පෞද්ගලිකව ම පරීක්ෂා කල යුතු බැව් අවධාරණය කෙරේ

A කොටස - පාසල් භූමිය/ ඉඩම පිළිබඳ තොරතුරු

- පාසල් ඉඩමේ භූමි ප්‍රමාණය අක්කර, රූඩ්, පර්චස් වලින්ම පමණක් ඇතුලත් කරන්න.
- පාසල් ඉඩමේ භූමි ප්‍රමාණය ඔබ සතුව ඇත්තේ හෙක්ටයාර් වලින් නම් පළමුව එය අක්කර වලට පරිවර්තනය කරන්න (හෙක්ටයාර් = 1 අක්කර 2.47 භාවිතයෙන්) ඉන්පසු එය පර්චස් වලට පරිවර්තනය කරන්න.

පර්චස් 40 = රූඩ් 1,	රූඩ් 4 = අක්කර 1	පර්චස් 160 = අක්කර 1

උදා: යම් පාසලක ඉඩමේ භූමි ප්‍රමාණය හෙක්ටයාර් 3.13ක් නම් එය **අක්කර, රූඩ්, පර්චස් වලට හරවා ගන්නේ මෙසේයි.**

හෙක්ටයාර් 3.13 X 2.47 = අක්කර 7.7311 - - - - > අක්කර 7

ඉතිරි අක්කර 0.7311 X 160 = පර්චස් 116.976/40 - - -> රූඩ් 2

පර්චස් 36.976 - - - -> පර්චස් 37 (පූර්ණ සංඛ්‍යාවට වටයා දක්වන්න.)

- **ක්‍රීඩා පිට්ටනියේ සම්පූර්ණ වටයක දුර**



වටයක දුර මීටර් 125



වටයක දුර මීටර් 300

B කොටස - පාසලේ පවතින පන්ති කාමර පිළිබඳ තොරතුරු

වෙන්කල පන්ති කාමර / වෙන්නොකල පන්ති කාමර ලෙස පන්ති කාමර ගණන ඇතුලත් කරන්න.

වෙන්නොකල පන්ති

වෙන්කල පන්ති කාමර

තාවකාලික ගොඩනැඟිලිවල පන්ති කාමර

C කොටස - පාසල් ලී බඩු උපකරණ පිළිබඳ තොරතුරු

1 වර්ගයේ සිසු ද්විත්ව මේස සහ 1 වර්ගයේ පුටු
(1 සහ 2 ශ්‍රේණි සඳහා භාවිතා කරන)

- 1 වර්ගයේ පුටුවක් පොළවේ සිට සෙ.මී. 52ක් උස වන අතර ඉදගන්නා කොටස පොළවේ සිට සෙ.මී. 28ක් උසින් පවතී, පුටුවේ ඇන්ද සෙ.මී. 24ක් උස වේ.
- **1 වර්ගයේ සිසු ද්විත්ව මේසයක්** සිසුන් දෙදෙනෙකු සඳහා භාවිතයට සකසා ඇති 1 වර්ගයේ ද්විත්ව සිසු මේසයක දිග සෙ.මී. 100 සහ පළල සෙ.මී. 40ක් වන අතර පොළවේ සිට සෙ.මී. 47.5ක් උස වේ.

2 වර්ගයේ සිසු මේස සහ පුටු (3,4 සහ 5 ශ්‍රේණි සඳහා භාවිතා කරන)

- 2 වර්ගයේ පුටුවක් පොළවේ සිට සෙ.මී. 62ක් උස වන අතර ඉදගන්නා කොටස පොළවේ සිට සෙ.මී. 32ක් උසින් පවතී, පුටුවේ ඇන්ද සෙ.මී. 30ක් උස වේ.
- **2 වර්ගයේ සිසු මේසයක** දිග සෙ.මී. 60 සහ පළල සෙ.මී. 45ක් වන අතර පොළවේ සිට සෙ.මී. 52ක් උස වේ.



4 වර්ගයේ සිසු මේස සහ පුටු
(6,7 ,8,9,10,11,12 සහ 13 ශ්‍රේණි සඳහා භාවිතා කරන)

- 4 වර්ගයේ පුටුවක් පොළවේ සිට සෙ.මී. 83ක් උස වන අතර ඉදගන්නා කොටස පොළවේ සිට සෙ.මී. 45ක් උසින් පවතී, පුටුවේ ඇන්ද සෙ.මී. 38ක් උස වේ.
- **4 වර්ගයේ සිසු මේසයක** දිග සෙ.මී. 65 සහ පළල සෙ.මී. 47ක් වන අතර පොළවේ සිට සෙ.මී. 73ක් උස වේ.

D කොටස - මූලික (ජලය, විදුලිය සහ සනීපාරක්ෂක) පහසුකම් පිළිබඳ තොරතුරු

- ජලය ලබාගන්නා මූලාශ්‍ර

Protected Well (ආරක්ෂිත ළිඳ)

Unprotected Well (අනාරක්ෂිත ළිඳ) - බාහිර ගොඩබිම් ජලය ළිඳට එක්වීම වැලැක්වීම සඳහා ළිඳ වටා ආරක්ෂිත බැම්මක් නොමැති ළිං

Rain Water Collecting Tank (වැසි ජලය එකතුකිරීමේ ජල ටැංකියක්

Water Filter Unit

ප්‍රශ්ණ අංක D6 යටතේ විමසා ඇත්තේ රජරට ආදී ප්‍රදේශ වල පානීය ජලයේ අති අධික ලවණතාවය වෙනත් රසායනික ද්‍රව්‍ය ඉවත් කිරීමට ජල පෙරහන් ඒකකයක්(Water Filter Unit) පවතී ද හා අවශ්‍යය ද යන්නයි.

පිරිසිදු පානීය ජලය සහිත ප්‍රදේශ වල පාසල් විසින් පිළිතුරු අංක 1 (පිරිසිදු කල ජලය ඇති බැවින් ජල පෙරන අවශ්‍ය නොවේ) කව කල යුතු වේ.

වැසිකිළි හා කැසිකිළි

- වරකට එක් අයකු භාවිතා කරන වැසිකිලි/කැසිකිලි ඒකකයක් එක් ඒකකයක් ලෙස සලකන්න.
- **වැසිකිළි වර්ග 4 යටතේ** වෙන් වෙන්ව සිසු වැසිකිළි ඒකක ගණන ඇතුලත් කරන්න.

වැසිකිළියක් තුළ වැසිකිළි ඒකක 4ක් ඇති අවස්ථාවක් / 4 Toilet Units in the same Toilet

වැසිකිළියක් තුළ වැසිකිළි ඒකක 1ක් පමණක් ඇති අවස්ථාවක්/ 1 Toilet Unit

වැසිකිළියක් තුළ කැසිකිළි ඒකක 2ක් ඇති අවස්ථාවක්/ 2 Urinal Units in a one toilet

වැසිකිළියක් තුළ වැසිකිළි ඒකක 1ක් පමණක් ඇති අවස්ථාවක්/ 1 Toilet Unit

වැසිකිළියක් පද්ධතියක් තුළ වැසිකිළි ඒකක 4ක් පමණක් ඇති අවස්ථාවක්/ 4 Toilet Unit in a single toilet system

G කොටස - වෙනත් පොදු පහසුකම් පිළිබඳ තොරතුරු

- ප්‍රාථමික අංශය සහිත පාසලක G වගුවේ දක්වා ඇති පහසුකම් ප්‍රාථමික අංශය හා ද්විතීයික අංශය සඳහා වෙන වෙන ම වෙන්ව පවතී නම් පමණක් ඒ ඒ අංශය යටතේ දක්වන්න.
- ප්‍රාථමික අංශය සහිත පාසලක G වගුවේ දක්වා ඇති පහසුකම් ප්‍රාථමික අංශය හා ද්විතීයික අංශය සඳහා වෙන වෙන ම වෙන්ව නොපවතී නම් ඒවා සියල්ල ද්විතීයික අංශය යටතේ පමණක් දක්වන්න
- එකම පහසුකම ප්‍රාථමික හා ද්විතීයික අංශ දෙක යටතේ ම නොදැක්විය යුතු වේ.
- ප්‍රාථමික අංශය යටතේ G වගුවේ දක්වා ඇති පහසුකම් දැක්විය යුත්තේ ප්‍රාථමික අංශය සඳහා වෙන ම පවතී නම් ම පමණි.
- එකවර භාවිතා කළ හැකි සිසුන් ගණන ලෙස සලකන්නේ එම ස්ථානයේ Seating Capacity එකයි.
- තාවකාලික පදනමින් පන්ති කාමර පොදු පහසුකම් ලෙස භාවිතා කරන්නේ නම් ඒවා 12 පිටුවේ සඳහන් කළයුතු වෙනත් කරුණු යටතේ ඒ බැව් දක්වන්න.

H කොටස - පරිගණක, පරිගණකාගාර හා අන්තර්ජාල පහසුකම් පිළිබඳ තොරතුරු

Desktop Computer

Laptop Computer

සැ.යු.: H කොටසේ දී දැක්විය යුතු පරිගණක ලෙස රජය මඟින් (අධ්‍යාපන අමාත්‍යාංශය/ පළාත් සභාව/ පළාත් අධ්‍යාපන ආයතන, විදේශීය ආධාර ව්‍යාපෘති) හා වෙනත් ඕනෑම පාර්ශවයකින් (පාසලේ ආදී ශිෂ්‍ය සංගම්, සුභ පතන්නන් ඇතුළු) පාසලට ලැබී ඇති සියළු වර්ගවල පරිගණක මේ යටතේ දැක්විය යුතු වේ.



Notebook Computers

Tablet/ Tablet Computers

- HX හා HY යටතේ දැක්විය යුත්තේ ඔබ පාසලේ ඇති දැනට ක්‍රියාකාරී තත්ත්වයේ පවතින Desktop, Laptop, Notebook හා Tablet පරිගණක ආදී සියළුම වර්ගවල මුළු පරිගණක සංඛ්‍යාවන් ඒවා දැනට පාසලේ තිබෙන/පවතින ස්ථානය අනුව HX වගුවේත්
- Desktop, Laptop, හා Tablet ලෙස පරිගණක වර්ගය හා ලැබුණු වර්ෂය අනුව HY වගුවේත් සඳහන් කරන්න. **Notebook පරිගණක Laptop යටතේ ම දක්වන්න.**
- දැනට අක්‍රීය තත්ත්වයේ පවතින අලුත්වැඩියා කර නැවත ප්‍රයෝජනයට ගත හැකි පරිගණක සංඛ්‍යාව HZA වගුවේ දක්වන්න.
- HZB වගුව යටතේ සිසුන්ගේ ඉගෙනුම් කටයුතු සඳහා සෘජුව ම හෝ සූදානම්වීම සඳහා පරිගණක විද්‍යාගාර/ කාමරවල ඇති පරිගණක සහ අන්තර්ජාල පහසුකම් ආදිය යොදා ගනී නම් ම පමණක් ඒ ඒ අංශය යටතේ ඔව් ලෙස දක්වන්න.